# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1791/34 – 2013 ජනවාරි 03 වැනි බ්‍රහස්පතින්දා – 2013.01.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: 04/03/01/10.
ඉඩම් අමාත්‍යාංශයේ අංකය: එල්ඩී/05/2010/ඩබ්ලිව්එස්/32.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 632 බී කදන දකුණ ග්‍රාම නිලධාරී වසමේ කදන ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ පිඹුරු අංක මු.පි.ක 4367හි කැබලි අංක 01 ප්‍රමාණයෙන් හෙක්. 0.2040 ක්වූ ඇල්ලමුල්ලහේන නැමති ඉඩම:

**කැබලි අංක 01**
ඉඩමේ නම: ඇල්ලමුල්ලහේන; විස්තරය: -; හිමිකම් කියන අය: දම්මි කරුණාරත්න අංක 05, කොළමුන්න පිළියන්දල; ප්‍රමාණය: හෙක්. 0.2040.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 පෙබරවාරි මස 15 වැනි දින පූ. භා. 10.00 ට මදුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2013 පෙබරවාරි මස 08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

මේනකා ප්‍රියන්තා අබේරත්න,
ප්‍රාදේශීය ලේකම්,
මදුරාවල.

2013 ජනවාරි මස 04 වැනි දින,
මදුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01 – 517